# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2015 මැයි මස 12 වන දින පෙ.ව. 9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප|VI(1)|15|16)

අ. i. අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට අයත් නිට්ටඹුව දිවිනැගුම සතිපොළ ටෙන්ඩර් ලබා දී ඇති බව ඔබතුමා දන්නේද ?

ii. එසේනම් එහි වාර්ෂික වටිනාකම කොපමණද ?

ආ. i. මෙහි 1000කට අධික වෙළඳුන් ප්‍රමාණයක් වෙළඳාම් කරන බව දන්නේද ?

ii. ඔවුන්ගෙන් ටෙන්ඩර් හිමිකරු සතියකට කොපමණ මුදලක් අය කරන්නේද?

iii. ඒ සඳහා රිසිට්පත් නිකුත් කරන්නේද?

ඇ. i. මෙම සතිපොළ භූමිය ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යාමට ඇති බාධාව කුමක්ද ?

ii. එසේ පවත්වාගෙන නොයාම නිසා ප්‍රාදේශීය සභාවට වාර්ෂිකව අහිමි වන මුදල කොපමණද ?

iii. ඉදිරියේදී මෙම පොළ භූමිය ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යමින් වෙළඳුන්ට සහනදායී අයකිරීම් මත ස්ථාන ලබා දීමට ඇති බාධාව කුමක්ද ?

02. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බලශක්ති. පළාත් මාර්ග,නිවාස හා ඉදිකිරීම් ජලසම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා, වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප|VI(1)|15|17)

අ. ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල මැතිවරණ කොට්ඨාශයට අයත් බෙම්මුල්ල ප්‍රදේශයේ බණ්ඩාර වටවල ගමෙහි මේජර් මුනිපුර ගුණපාල මාවත සංවර්ධනය කිරීම සඳහා පසුගිය ආණ්ඩුවේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘතියක් යටතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ඇති බව ඔබතුමා දන්නේද ?

ආ. i. මේ වන විට කාපට් කිරීමේ අරමුණින් එම මාර්ගයේ අතුරා තිබූ තාර තට්ටුව ගලවා දමා ඇති බව ඔබතුමා දන්නේද?

ii. ඒ නිසා එහි ගමන් කිරීමේදී ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවයකට මුහුණ දී ඇති බව පිළිගන්නේද ?

ඇ. i. මීටර් 780 පමණ දිග මෙම මාර්ගය කාපට් කිරීම සඳහා නිට්ටඹුව මාර්ග සංවර්ධන අධිකාරි කාර්යාලය මගින් ඇස්තමේන්තු සකසා තිබේද?

ii. එම මුදල කොපමණද?

ඈ. මෙම මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීම ආරම්භ කරන්නේ කවදාද ?

03. ගරු ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා, සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂයභාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප| VI (1)|15|18)

(අ). මීගමුව අධ්‍යාපන කලාපයේ පිරිපන මහා විද්‍යාලයේ ප්‍රධාන ශාලා ගොඩනැගිල්ල අළුත්වැඩියා කළ නොහැකි පරිදි අබලන් වී ඇති බව ඔබතුමා දන්නෙහිද ?

(ආ). වහාම ඉන් සිසුන් ඉවත් කරන ලෙස 2012 වසරේදී ප්‍රාදේශීය ඉංජිනේරු විසින් නිර්දේශ කර ඇති බව ඔබතුමා දන්නෙහිද ?

(ඇ). ඉඩකඩ නොමැති නිසා පන්ති කිහිපයක සිසුන් තව දුරටත් එහි දැඩි අනාරක්ෂිත වාතාවරණයක අධ්‍යාපනය හදාරන බව දන්නෙහිද ?

(ඈ). නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2012 වසරේදී වැඩ ආරම්භ කර ඇති නමුත් ඉදිකිරීම් ඇණ හිට ඇති බව දන්නේද ?

(ඉ). එම අර්ධ ඉදිකිරීම් ද දැන් දිරාපත් වෙමින් පවතින බව ඔබතුමා දන්නේද ?

(ඊ). මෙම ඉදිකිරීම් අතරමග නතරවීමටත් යළි එය ආරම්භ කිරීමටත් නොහැකි වීමට හේතු පැහැදිලි කරන්නේද?

(උ). මෙම ඉදිකිරීම කඩිනමින් නිම කිරීමටත් එතෙක් සිසුන්ට අධ්‍යාපනය ලැබීමට සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමටත් ගන්නා පියවර කවරේද ?

(ඌ). 2017 ආසියානු ක්‍රීඩා උළෙලට සමගාමීව විදුහලේ ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ 05ක මුදලක් වෙන්කර තිබූ බව දන්නෙහිද ? ඒ අනුව සංවර්ධන කටයුතු සිදු වී ඇද්ද ?

(එ). විද්‍යාලයේ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණදැයි සඳහන් කරන්නේද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත තුළ මේ වන විට පාසැල් දරුවන්ගෙන් දෙමාපියන්ගෙන් විටින්විට මුදල් අයකිරීම් සිදුවේ, පළමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුලත්කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මෙලෙස මුදල් එකතුකිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇත. එබැවින් බස්නාහිර පළාත තුල දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මුදල් එකතුකිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

(යෝ/VI (1) /14/09)

### 02. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත් පාසැල් සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත්කර ගැනීමේදී දරුවන් හා දෙමවුපියන් පීඩාවට පත්කරන වර්තමාන ක්‍රමවේදය වෙනස්කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා දරුවන් පාසලට ඇතුලත්කර ගන්නා දින සිට මාසයක් ඉක්ම යාමට පෙර සියලු පුරප්පාඩු පුරවා අවසන් කිරීමත්, ආරක්ෂක අංශවල සේවයේ නියුක්ත වුවන්ගේ දරුවන්ගේ නාම ලේඛනය දරුවන් ඇතුලත් කර ගත් දිනයේ සිට සති 3 ක් ඉක්ම යාමට පෙර පළාත් සභාවට ලැබීමට සැලැස්වීමත්, පාලක පක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන නාම ලේඛණයට අනුව ළමුන් ඇතුලත් කර ගන්නා ක්‍රමය අහෝසි කිරීමත්, සම්මුඛ පරීක්ෂණ වලට සහභාගි වන සැම දරුවෙකුටම ලැබෙන ලකුණු අනුව ස්ථිර ලේඛනයක් ලකුණු අනුපිළිවෙලට අනුව සකස් කිරීමත් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පාසලට දරුවන් ඇතුලත් කිරීමට පියවර ගැනීමත් කළ යුතුයැයි ද, ඒ අනුව බස්නාහිර පළාතේ පාසැල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේ කටයුතු විධිමත් කර පාසලකට දරුවෙකු ඇතුලත් කිරීමට තිබෙන මානව අයිතිය පළාතේ ජනතාවට තහවුරු කළ යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ /VI (1) /14/10)

## X. සභාව කල් තැබීම

2015.04.29 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභා